# සෙබළු සිතුවිලි දෙසතිය

2025
ජූනි
01 - 15

වෙළුම
LXIV

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශණයකි





# සෙබළ හදවත

රට වෙරළු පාට වැටුණු ඒ ඇඳුමට
අතපය සීතල කරන ඒ ගිනි බටයට
දැනුණු හැඟුම් තරුණ හිත යට
ඉෂ්ඨ කරා ඇවිත් යුතුකම හමුදාවට

**මේජර් එස්එම් බස්නායක**
**10 ශ්‍රීලංසිරෙ**



# ආඩම්බර නොවන්න

දිනක් සාර්ථක වූ විට කල්පයක්
ආඩම්බර නොවන්න....
දිනක් අසාර්ථක වූ විට කල්පයක්
කණගාටු නොවන්න....
සැමදා දිනුමද...
සැමදා පැරදුමද නැත...

ලාන්ස් කෝප්‍රල් සංජීව එච්පීඩීජී
19 ශ්‍රීලපාහ

# ප්‍රේමය

බැඳුනත් නීතියේ යදම්වලින්
හැකිද එකවර මරා දමන්නට
ප්‍රේමයේ අභිමන්.
සම්මත වුවත් අසම්මත වුවත්
බැඳුනු හදවත් හැකිද මරා දමන්නට
නීතියේ බොරු පෑන් තුඩකට.
හේතු දහසක් මවා පෑවත්
මග හරින්නට මගේ හදවත.
සසර දිගුව පසක් වන විට
නුඹ සමඟ එක ආත්මයක් වත් මග
නොහැර යන්නට එමි...

කෝප්‍රල් සෙනෙවිරත්න ජේආර්
6 කාඉරෙ

# රණවිරුවා

භූරතලයට තුරුලට එන
පුංචි දෝනි ගෙදර දමා......
ගිනි අවිය ලගට ගත්තේ
රට දැය රැක
නුබේ දිවිය ගොඩ නගන්නයි.....
දරු කැක්කුම ඉහට උඩින්
ජීවන බර ඊට උඩින්
මේ හැමටම වඩා ලොකුයි
දුවේ නුබේ අනාගතේ...../ /

ලාන්ස් කෝප්‍රල් රත්නායක ආර්එම්ජ්
රෙපිමුබ ගැහේබ

# හදවත

සුසුම් සලන හන්තානක
කඳුළු ගලන මධ්‍යහනක
එක සුදු පැහැ මලක් වෙලා
නුඹ පිපුනිද මගේ ලොවට

ඈ ගියාලු මං දාලා
සුසුම් කඳුළු රන්දාලා
හැර යන කඳුලද සුසුමද
යන්න එපා මං දාලා



රයිෆල් සෙබල සේනානායක එස්එම්එස්එන්
14 ශ්‍රීලංසිරෙ

# සෙබළ සිතුවිලි

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනයකි



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය | www.army.lk | 011 2076967